**අකුරැස්ස ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 නොවැම්බර් 25 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු ටිපර් රථයේ වටිනාකම රු.1,609,602 කින් අඩුවෙන්ද, කර්මාන්ත ණයහිමි ශේෂය රු.19,923,140 කින් වැඩියෙන් ද, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) 1992 වර්ෂයේදී සභාවට ලැබී තිබූ පිරිවැය රු.625,000 ක් වූ කැබ් රථයේ වටිනාකම සමාලෝචිත වර්ෂයේදීත් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාළව ලැබී තිබුණු රු.1,414,104 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ලැබීම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම් සහ ලැබිය යුතු මුද්දර ගාස්තු සමාන අගයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂවල එකතුව සහ ඊට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.216,045 ක අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.4 ලැබිය යුතු ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එකතුව රු.29,879,056 ක් වූ විවිධ ණයගැති ශේෂය තුළ අවුරුදු 03 ක කාලය ඉක්මවා තිබුණු රු.3,374,182 ක ශේෂ 09 ක් ඇතුළත් වී තිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------------

එකතුව රු.35,132,767 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ විධිමත්ව හා යාවත්කාලීනව පවත්වන ලද ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය හා හිමිකම් ඔප්පුද, රු.59,171,299 ක් වූ මෝටර් රථ හා කරත්ත පිළිබඳ ගලපන ලද වටිනාකම් ඇතුළත් උපලේඛනයද, රු.7,968,314 ක් වූ ණයගැති ශේෂ හා රු.8,234,778 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂ සම්බන්ධයෙන් ණයගැති හා ණයහිමි ලේඛනද, ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම්

-----------------------------------------------

පහත විස්තර දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, රගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(i) මුදල්රෙගුලාසි 570 හා 571 | එකතු වටිනාකම රු.1,828,171 ක් වූ කාලය ඉක්මවූ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල්රෙගුලාසි 1645 හා 1646 | සභාවට අයත් වාහන 21 කට අදාළ දෛනික ධාවන සටහන්පත් හා මාසික කාර්ය සාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.8,752,279 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.14,315,636 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,563,357 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

**2.2 විශ්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වියදමේ සියයට 12 ක වැඩිවීමක් සිදු වී තිබූ අතර, මුළු පුනරාවර්තන ආදායමින් සියයට 85 ක් තරම් මුළු පුනරාවර්තන වියදම් පැවැතීම නිසා සභාවේ ආදායමට සාපේක්ෂව වියදම් ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ මුළු පුනරාවර්තන ආදායම්, ආදායම් ආධාර හා ස්වයං උත්පාදන ආදායම් සහ මුළු පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ආධාර | ස්වයං උත්පාදිත ආදායම් | මුළු පුනරාවර්තන වියදම් | ස්වයං උත්පාදිත ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 58,160,874 | 27,705,313 | 30,455,561 | 49,408,595 | (18,953,034) |
| 2014 | 52,766,032 | 19,456,106 | 33,309,926 | 38,483,396 | (5,173,470) |
| 2013 | 46,321,753 | 17,686,900 | 28,634,853 | 36,638,432 | (8,003,579) |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය ඇතුළු ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ ආදායම් ආධාර වල වර්ධනයක් පවතින නමුත්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව ස්වයං උත්පාදන ආදායමේ රු.2,854,365 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි.

(ii) සෑම වර්ෂයකම පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් සැලකිය යුතු අගයන්ගෙන් වර්ධනය වී ඇති නමුත්, එම තත්ත්වය අවම කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(iii) සභාවේ ස්වයං උත්පාදන ආදායම ඉක්මවා වර්ෂ තුනෙහිම සැලකිය යුතු අගයන්ගෙන් පුනරාවර්තන වියදම් වැඩිවී ඇති බවත්, ආදායම් ආධාර නොලැබෙන්නට ස්වයං උත්පාදන ආදායම් වලින් කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බවත් නිරීක්ෂණය විය.

(iii)

(ඇ) ශුද්ධ වත්කම්
----------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ වත්කම් රු.21,272,999 කින් හෙවත් සියයට 14 කින් අඩුවී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය
------------------------

### 2.3.1 වරිපනම් හා බදු
-------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ආරම්භක හිඟයෙන් සියයට 28 ක් සහ බිල්කිරීම් වලින් සියයට 80 ක් වර්ෂය තුළ අයකර ගෙන තිබුණු නමුත්, හිඟ වරිපනම් බදු අයකිරීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා අක්කර බදු බිල් කර නොතිබුණු අතර, ආරම්භක හිඟ ශේෂයෙන් සියයට 19 ක් පමණක් අයකර ගෙන තිබුණි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.3.2 බදුකුලී
---------

සමාලෝචිත වර්ෂයේදී ආරම්භක හිඟයෙන් සියයට 17 ක් හා බිල්කිරීම් වලින් සියයට 75 ක් අයකර ගෙන තිබුණු නමුත්, හිඟ මුදල් අයකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

### 2.3.3 කඩකාමර බදු
-------------------

දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2010 නොවැම්බර් 07 දිනැති අංක දපපා/පාපාකො/2010/01 දරන චක්‍රලේඛය පරිදි බංගම පාරේ පිහිටි පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමර 51 ක කුලී අය කර නොතිබුණු අතර, 2007 වසරේ සිට කඩකාමර 07 ක් බදු නොදීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,188,000 ක ආදායම් සභාවට අහිමි වී තිබුණි.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,189,790 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.13,995,000 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

3.1 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත සංඛ්‍යාව ඉක්මවා සේවයේ යොදවා තිබුණු සේවකයින් 05 දෙනෙකුගේ තනතුරු විධිමත් කර ගැනීමට මෙන්ම, තනතුරු 04 ක පැවති පුරප්පාඩු පුරවා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.2 සේවක ණය**

---------------

සේවකයින් 10 දෙනෙකු ගෙන් වසර 10කට පෙර අයවිය යුතු එකතුව රු.54,133 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 ආර්ථික නොවූ ගනුදෙනු**

----------------------------

නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට තෝරාගත් භූමියේ තිබූ කඩකාමර වෙනත් ස්ථානයක ඉදිකිරීම සඳහා දරන ලද රු.1,140,370 ක වියදම නිෂ්ඵල වී තිබුණි.

**3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2002 වර්ෂයේ සිට කසල බදු අය කිරීමට අතුරු ව්‍යවස්ථා පනවාගෙන තිබුණද, කසල බදු අය කර නොතිබුණි.

(ආ) කසල බැහැර කරන පෞද්ගලික ඉඩම සභාවට පවරා ගැනීමට හෝ පරිසර බලපත්‍රයක්ද ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රෝහල්, කර්මාන්තශාලා, නිවාස සංකීර්ණ හා මාංශ අලෙවිසැල් මගින් වර්ෂයකට ටොන් 110 ක පමණ කසල බැහැර කළද, ඒ සඳහා බදු අයකර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.1 අයවැය පාලනය

අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 05 ක එකතුව රු.11,752,201 ක් වූ ඉතිරි කිරීම්ද, වියදම් විෂයයන් 02 ක සීමාවන් ඉක්මවූ රු.1,220,661 ක වියදම්ද, ආදායම් විෂයයන් 06 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.6,310,785 ක්ද, අයවැයගත ඉලක්කගත ආදායම ඉක්මවා ආදායම් විෂයයක රු.4,338,169 ක අයකිරීම්ද යනාදී හේතු නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු නමුත්, අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.427,992 ක මුදලක් ගෙවා තිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටුව

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

### 4.4 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් පරිදි ඉඩම් හා ගොඩනැගිලි 28 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට එකඟවූ නමුත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය